**ශීර්ෂය-283 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

**--------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පින්ඩන වාර්තාව 2022 මැයි **31** දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි **31** දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**----------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයෙහි අවසානයේ දේපළ පිරියත හා උපකරණ වටිනාකම රු.2,521,122,965 ක් වූ අතර භාණ්ඩාගාර මුද්‍රිත අනුව එය රු.2,890,484,840 ක් වූයෙන් රු.369,361,875 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොමැත. | නිවැරදි දත්ත ඇතුලත් කර ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | වර්ෂයට අදාල වැය විෂය අංක 2401 යටතේ වූ හැකියා වර්ධන වියදම වැය ලෙජරයේ හා ශේෂ පිරික්සුමේ රු.577,426 ක් ලෙස දක්වා තිබුණ ද එම අගය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි රු.5,577,426 ක් ලෙස දක්වා තිබිමෙන් මුළු මූලධන වියදම රු.මිලියන 5 ක් වැඩියෙන් දක්වා තිබුණි. | - එම - | - එම - |
| (ඇ) | 2021 වර්ෂය තුල දරන ලද මූලධන වියදම රු.45,662,554 ක් වූ අතර එය මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවේ (SA 82) රු.6,731,826 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් රු.38,930,728 ක් ගිණුම්වලින් අතහැරී තිබුණි. | - එම - | - එම - |
| (ඈ) | දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ප්‍රකාශන තුලින් හෙළිදරව් කර ඇති ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.298,308,700 ක් වූ අතර 2021 ජනවාරි 01 දිනට රු.415,455 ක් වූ නිලනිවාස වටිනාකමට රු.3,370,000 ක එකතු කිරිමක් සිදුකර තිබුණි. ඒ පිළිබඳ විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය. | - එම - | - එම - |

| | | |
|---|---|---|
| (ඉ) ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් 2021 වර්ෂය තුල රු.1,237,217,599 ක වියදමක් දරා තිබුණු අතර එය මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවේ(SA 82) රු.49,081,885 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව රු.1,188,135,714 ක් මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවට ඇතුලත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | නිවැරදිව ගිණුම් පිළියෙල කර තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) බැරකම් ලේඛනය<br>මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳව ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳව ලේඛනයක් පවත්වා ගෙන යා යුතුය. |
| (ආ) ස්ථාවර වත්කම් ලේඛනය<br>මූල්‍ය නොවන වත්කම්හී ගිණුම්වල නිවැරදිතාවය පවත්වා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විධිමත් ලෙස පොත්පත් පවත්වාගෙන යායුතු වුවත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | - එම - | චක්‍රලේඛ විධිවිධාන අනුව වත්කම් නිවැරදිව වාර්තා කිරීමටත්, ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) CC10 ලේඛනය<br>2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ නිලධාරියන්ගේ අත්තිකාරම් “ බී ” ගිණුම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් ගිණුම් ක්‍රමයක් හා අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වා ගැනිම සඳහා CC10 ලේඛනය ආශ්‍රයෙන් පිළියෙල කරන ණය හා අත්තිකාරම් ලේඛනය, ණය ගැති ලේඛනය, ණය හිමි ලේඛනය හා අත්තිකාරම් පාලන ගිණුම, ගිණුම් ඉදිරිපත් කරන දිනට නිසි පරිදි ලියා ශේෂ කළ වුවත් උක්ත කිසිදු ලේඛනයක් යාවත් කාලීන කර නොතිබුණි. | - එම - | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | හානි පිලිබඳ ලේඛනය<br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 110 ප්‍රකාරව හානි පිලිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි. | - එම - | මු.රෙ. 110 ප්‍රකාරව හානි පිලිබඳ ලේඛනය පවත්වා ගත යුතුය. |

### 1.6.3 විගණන සාක්ෂි නොවීම

--------------------------

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | නිරීක්ෂණය<br>------------- | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම<br>--------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ රැස් කරන ලද මුළු හිග ආදායම රු.27,972,306 ක් වූ අතර, එක් එක් වර්ෂයේ හිග ආදායම් වලින් රැස් කරන ලද ආදායම වෙන වෙනම හදුනා ගත හැකි පරිදි ලිඛිත තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම සංඛ්‍යාවල නිවැරදිතාවය තහවුරු කර ගැනිමට නොහැකි විය. | වාර්තා කරනු ලබන වසර තුල හිඟ මුදලට අනුරූපීව රැස් කරන ලද මුලු ප්‍රමාණය ලෙස මෙය ආදායම් ගිණුමෙහි සඳහන් කර ඇති අතර, පෙර වර්ෂ කිහිපයක ගිණුම් පරීක්ෂා කලද ඒසීඒ 1 හි හිඟ ආදායම් තීරුවෙහි එම අගයන් සඳහන් කර නොමැති බැවින් මෙම වර්ෂයේ ද එම අගයන් සඳහන් නොකරන ලදි. | - එම - |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මුද්‍රිත සටහනේ SA 82 මූලා‍ය නොවන වත්කම් වාර්තාවේ රු.116,000,000 ක ඉඩම් අපහරණය කල බව දක්වා තිබුණ ද ඒ පිළිබඳ විස්තරාත්මක ලිඛිත තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය. | පිළිතුරු ලබා දී නොමැත. | - එම - |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (I) | මුදල් රෙගුලාසි 395(ඇ) | එක් එක් මාසයක් අවසන් වී ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම සකස් කළ යුතු වුවත් 2021 දෙසැම්බර් මස ප්‍රධාන කාර්යාලයේ ජංගම ගිණුමකට අදාල බැංකු සැසඳුම පිළියෙල කිරීම මාස 02කට අධික කාලයක් ප්‍රමාද කර තිබුණු අතර 2022 ජනවාරි මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය ද 2022 මැයි මස අවසන් වන විටත් පිළියෙල කර නොතිබුණි. | මු.රෙ.395(ඇ) ප්‍රකාරව ඉදිරියේ දී නියමිත දිනට බැංකු සැසඳුම් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මු.රෙ.395(ඇ) ප්‍රකාරව බැංකු සැසඳුම් පිළියෙල කළයුතුය. |
| (II) | මුදල් රෙගුලාසි 396 (ඇ) | ප්‍රධාන කාර්යාලයේ බැංකු ගිණුමකට අදාලව නිකුත් කළ දින සිට මාස 06 ට වැඩිකාලයක් ඉක්මවූ උපලබ්ධි නොවූ රු.50,160 ක් වටිනා චෙක්පත් 06 ක් සහ දිසා වන කාර්යාල බැංකු ගිණුම් 08 කට අදාලව බැංකුවට ඉදිරිපත් නොවූ රු.133,957 ක් වූ චෙක්පත් 67 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. | මුදල් රෙගුලාසි ප්රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (III) | මුදල් රෙගුලාසි 565 (3) | පොදු තැන්පත් ගිණුම සම්බන්ධයෙන් තුලන ගිණුමක් පිළියෙල කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව, පොදු තැන්පත් ගිණුම වෙනුවෙන් තුලන ගිණුම් පිළියෙල කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | - එම - |
| (IV) | මුදල් රෙගුලාසි 565(5) | තැන්පත් ගිණුමට අදාලව පොදු 71 ආකෘති පත්‍රයෙහි පිළියෙල කරනු ලබන මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළග මාසය අවසන් විමට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත් එම සාරංශ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. | - එම - | - එම - |
| (ආ) | 2016 මාර්තු 31 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 | දෙසැම්බර් 15 ට දිනට පෙර සමීක්ෂණ මණ්ඩල පත්කර මුදල් රෙගුලාසි 128 හි සඳහන් කාල රාමුව තුල භාණ්ඩ සමීක්ෂණයන් කල යුතු නමුත් දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයන් 2022 අප්‍රේල් 18 දින වන තුරු ද අවසන් කර නොතිබුණි. | - එම - | රාජ්‍ය මුදල් චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණයන් නියමිත කාල රාමුව තුල කල යුතුය. |

## 2.2 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | නිරීක්ෂණය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂය අවසානයට වවුනියාව දිසා වන කාර්යාලයට අදාලව පෞද්ගලික ව්‍යාපාරිකයන්ගෙන් රු.166,426,259 ක හිඟ ගාස්තුවක් අයකර ගත යුතුව තිබුණි. එහෙත් එම මුදල්වලින් සියයට 75 ක ප්‍රමාණයක් අවකරණය කර සියයට 25 ක ප්‍රමාණයක් එනම් රු.41,606,565 ක් පමණක් අය කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. එබැවින් වවුනියා දිසාවන කාර්යාලට පමණක් රු.124,819,694 ක අලාභයක් සිදු වී තිබුණි. | වවුනියාව දිසාවේ අයවිය යුතු හිඟ මුදල් පිළිබඳව වන සංරක්ෂක (ආරක්ෂණ හා නීති ක්‍රියාත්මක කිරීම)ගේ අංක: DFC/PLE/06/06/01/2021 හා 2021.02.22 දිනැති ලිපිය මඟින් ලබා දුන් උපදෙස් අනුව, ඒක් ඒක් පුද්ගලයන් හෝ ආයතනයන් විසින් ගෙවිය යුතු හිඟ මුදල 2021 මාර්තු 01 සිට වාරික 36 කින් අයකරගනිමින් පවති. | මෙම තීරණය හේතුවෙන් රජයට සිදු වී ඇති අලාභය තවදුරටත් සිදු වීම වලක්වා ගැනීමට අවශ්‍ය තීරණ ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන ගැසට් නිවේදනය අනුව 2020 වර්ෂය දක්වා දෙපාර්තමේන්තු කලමනාකරණය යටතේ පවතින ඉඩම්වල පිහිටි කළුගල් කඩා ඉවත් කිරීමේ දී, කොන්ත්‍රත්කරුවන්ගෙන් පහත පරිදි ගාස්තු අයකර තිබුණි.<br><br>කියුබ් ප්‍රමාණය --------- / ගල් කියුබයකට අයකළ රාජ්‍ය භාගය -------------------<br>රු.<br>01-50   250<br>51-250   500<br>251-1000   750<br>1000ට වැඩි   1000<br><br>එහෙත් 2020 නොවැම්බර් 13 දිනැති අංක 14/2020 දරන එකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් අයකල යුතු ගාස්තුව සියයට 50 ක ප්‍රමාණයකින් අඩු කිරීමට යෝජනාකරමින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තු ආදායම විශාල ලෙස පහළ ගොස් තිබුණි. වර්තමාන වෙළඳපල තත්වයන් යටතේ කැණීම් කොන්ත්‍රාත්කරුවන් විසින් නිරන්තරයෙන් කළුගල් මිල ඉහළ දැමීමේ ප්‍රවනතාවයක් පවතින බැවින් ද, ඔවුන් විසින් රාජ්‍ය දේපළ භාවිතයෙන් විශාල ලෙස ලාභ උපයන බැවින් ද, පෙර අයකළ ගාස්තු ප්‍රමාණයන් වැඩි කර රජයේ ආදායම වැඩිකර ගැනීම සඳහා කටයුතු නොකර එය අඩු කිරීම සඳහා තිරණගෙන තිබුණි. | අදහස් දක්වා නොමැත. | පවතින ගාස්තු අඩු කිරීමට කටයුතු නොකල යුතු අතර ගාස්තු වාසිදායක වන ආකාරයට සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 වර්ෂය සඳහා වවුනියාව ගල් කොරි හිමිකරුවන්ගෙන් වැඩිපුර කැණීම් වෙනුවෙන් අයවිය යුතු මුදල රු.15,052,840 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට එයින් තව දුරටත් හිඟව පැවති රු.8,054,223 ක් අයකර ගෙන නොතිබුණි. | වවුනියාව දිසාවේ අයවිය යුතු හිඟ මුදල් පිළිබඳව වන සංරක්ෂක (ආරක්ෂණ හා නීති ක්‍රියාත්මක කිරීම්)ගේ අංක: DFC/PLE/06/06/01/2021 හා 2021.02.22 දිනැති ලිපිය මඟින් ලබා දුන් උපදෙස් අනුව, එක් එක් පුද්ගලයන් හෝ ආයතනයන් විසින් ගෙවිය යුතු හිඟ මුදල 2021 මාර්තු 01 සිට වාරික 36 කින් අයකරගනිමින් පවතී. | හිඟ ආදායම් නිවැරදිව ගණනය කර ගිණුම් වල නිවැරදිව දැක්විමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | වවුනියා දිසා වන කාර්යාලය යටතේ පාලනය වන දැව ව්‍යාපාර 58 ක් ලියාපදිංචිය අළුත් නොකිරීම නිසා දෙපාර්තුමෙන්තුවට ලැබිය යුතුව පැවති රු.513,870 ක හිඟ ආදායම් අහිමි වී තිබුණි. | ලියාපදිංචිය අලුත් නොකරන ලද දැව ව්‍යාපාර පවත්වාගෙන යන්නේ නම්, එම දැව ව්‍යාපාර හිමියන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීමටත් පවත්වාගෙන නොයන්නේ නම්, ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා කටයුතු කරන ලෙස අඩවි වන නිලධාරී වෙත උපදෙස් ලබා දී ඇත. | ව්‍යාපාර ලියාපදිංචිය පිළිබඳව පසුවිපරම් කර හිඟ ආදායම් වාර්තා කිරීමට අදාළ නිළධාරීන් කටයුතු කළ යුතුය. |
| (ඉ) | වවුනියා දිසා වන කාර්යාලයේ පරිපාලනය යටතේ පවතින රජයේ ඉඩම්වල සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීමට බදු දීම වෙනුවෙන් පෞද්ගලික ආයතන 02 කින් 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවට අයවිය යුතු රු.28,501,491 ක ආදායමක් හිඟව පැවතුණ ද අවසන් ගිණුම්වල දක්වා නොතිබුණි. | මෙම කුළුණු 02 ක හමුදා කඳවුර තුළ පිහිටා ඇත. වාර්ෂික බලපත්‍ර ලබා ගැනීමට අදාළ H7/M/20/2015 පෝරමය මඟින් ඉදිරි කටයුතු සහ ක්‍රියාමාර්ග සිදුකරමින් පවතී. | සම්ප්‍රේෂණ කුළුණු පවත්වාගෙන යෑම පිළිබඳව පසුවිපරම් කර අදාල ආදායම් ගිණුම් සමඟ වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | වවුනියාව අඩවියේ පර්චස් 10 ක ඉඩම් ප්‍රමාණයක වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසරයකින් තොරව 2009 වර්ෂයේ සිට පුද්ගලික සමාගමක් විසින් සම්ප්‍රේෂණ කුළුණක් පවත්වාගෙන යෑම වෙනුවෙන් 2009 ජනවාරි 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා වර්ෂ 12 කට අදාළ රු.8,290,348 ක හිඟ ගාස්තුව අයකර ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අදාල ආයතනයේ කළමනාකරු වෙත වන සංරක්ෂක (ආරක්ෂණ හා නීති ක්‍රියාත්මක කිරීම්) විසින් අංක: H12/3/මැණික්ෆාම්/20/20 හා 2020.11.11 දිනැති ලිපිය මඟින් ගෙවිය යුතු රු.7,350,335 ක මුදල ගෙවන ලෙස දන්වා යවා ඇත. | හිඟ ආදායම් කඩිනමින් අය කරගෙන ගිණුම් සමඟ වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 වියදම් කළමනාකරණය

| නිරීක්ෂණය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව මඟින් දෙපාර්තමේන්තුවේ ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා කටයුතු සඳහා රු. මිලියන 10 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඊට අමතරව දේශීය ගමන් වියදම් වැය විෂයයෙන් රු.1,500,000 ක් හා විදේශීය ගමන් වියදම් වැය විෂය සඳහා වෙන් කර තිබුණු රු.1,500,000 ක සම්පූර්ණ මුදලම මු.රෙ.66 යටතේ ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමේ වැය විෂයයට මාරුකර පාලනයකින් තොරව ලිපි ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි. | අදහස් දක්වා නැත. | අවශ්‍යතාව නිවැරදිව හඳුනාගෙන මනා කළමණාකාරිත්වයෙන් යුතුව වියදම් දැරිය යුතුය. |

## 2.4 අධිවැය

| නිරීක්ෂණය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 දෙසැම්බර් 31 දිනට වියදම් ප්‍රකාශය අනුව අධිවැය වාර්තා කර නොතිබුණ ද පුනරාවර්තන වැය විෂයන් 03 කට හර කළ යුතු වියදම් මූලධන වැය විෂයයන්ට හර කරමින්, ඇති වී තිබුණු අධිවැය හෙළදරවු කිරීමෙන් වැලකී තිබුණි. ගෙවීම් වවුචර පරීක්ෂාවට අනුව පහත පරිදි එය සිදු කර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මුදල් රෙගුලාසි 66 ට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | වැය ලෙජරයට අනුව වියදම | මූලධන වැය විෂයයන්ට හර කල වියදම | මුළු වියදම | මුළු ශුද්ධ ප්‍රතිපාදනය | අධි වැය |
| --- | --- | --- | --- | --- | --- |
| | රු. | රු. | රු. | රු. | රු. |
| 283-1-1-1301 | 13,987,049 | 1,378,456 | 15,365,505 | 14,000,000 | 1,365,505 |
| 283-1-1-1302 | 994,841 | 68,262 | 1,063,103 | 1,000,000 | 63,103 |
| 283-1-1-1303 | 2,496,912 | 62,820 | 2,559,732 | 2,500,000 | 59,732 |

## 2.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට මාස 03 සිට වසර 05 ඉක්මවා ගොස් තිබුණු එකතුව රු.11,756,676 ක ණය ශේෂයක් පැවති අතර මෙම ණය මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය අනුව කටයුතු කළ යුතු වුවත් කලමනාකාරිත්වය විසින් අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිලධාරියෙකු විශ්‍රාම යාමේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වෙබ් පිටුවෙහි එම නිලධාරියාට අදාල තොරතුරු යාවත්කාලීන වීමට යම් කාලසීමාවක් ගත වන බැවින් එම ණය ශේෂ නිරවුල් කිරීමට සැලකිය යුතු කාලසීමාවක් ගත වන බව කාරුණිකව දන්වා සිටිමි. මියගිය, සේවයෙන් පහකල හා සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ණය අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී. නුවරඑළිය කලාප නියෝජ්‍ය වන සංරක්ෂක කාර්යාලයට අනුබද්ධව සේවය කර විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන්, තිදෙනෙකුගෙන් ලැබිය යුතු | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | රු.215,635 ක ආපදා ණය ශේෂ නිරවුල් කිරීමේදී කලාපය විසින් එය දෙවරක් නිරවුල් කර ගිණුම්ගත කිරීම නිවැරදි කරමි. | |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10 වන ඡේදයේ උපදෙස් ප්‍රකාරව අත්තිකාරම් “බී” ගිණුම පිළියෙල කිරීමට අදාලව 2020 සැප්තැම්බර් 02 දින නිකුත් කර ඇති මාර්ගෝපදේශයේ අංක 01 හි (අ) ඡේදය අනුව දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් හා ස්ථාන මාරුවී පැමිණි නිලධාරිනේග් ණය ශේෂ මාස 03 ක් ගතවීමට පෙර නිරවුල් කල යුතුය. එසේ වුවද දෙපාර්තමේන්තුවට ලැබිය යුතු මාස 03 ත් 12 ත් අතර ආපදා ණය රු.202,500 ක් හා උත්සව අත්තිකාරම් රු.30,000 ක එකතුව රු.232,500 ක ණය ශේෂයක් හා වර්ෂයට වැඩි කාලයක සිට පැවතෙන රු.10,000 ක උත්සව අත්තිකාරම් ශේෂය ද වර්ෂයකට වැඩි කාලයක සිට දෙපාර්තමේන්තුවෙන් ගෙවිය යුතු රු.1,500 ක ආපදා ණය මුදල් ශේෂය ද නිරවුල් කර නොතිබුණි. | ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය වෙත ස්ථාන මාරු ලබා ගිය එක් නිලධාරියෙකුගේ ආපදා ණය ශේෂය වූ රු.202,500 ක මුදල එම ආයතනය විසින් නිරවුල් කල යුතු වුවද 2021 වර්ෂය අවසානය තෙක් නිරවුල් කර නොතිබුණි. එමෙන්ම අනෙකුත් නිලධාරීන් තිදෙනා ස්ථාන මාරු ලබා යාමේදී අදාල ආයතන වෙත යොමු කරන ලද වැටුප් විස්තරවල උත්සව අත්තිකාරම් මුදල් (රු. 30,000) ඇතුලත් නොකර යොමු කර ඇත. එය මෙම වසරට අදාල අත්තිකාරම් “බී” ගිණුම මඟින් නිවැරදි කරන බව කාරුණිකව දන්වා සිටිමි. ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත නිරවුල් කල යුතුව තිබූ රු.235,000 ක ණය ශේෂය 2021.11.15 දින එම ආයතනය විසින් නිරවුල් කර තිබුණද 2021 වර්ෂය අවසානය තෙක් එය CIGAS පද්ධතියෙහි යාවත්කාලීන කර නොතිබුණි. එය 2022 වර්ෂයේ පෙබරවාරි මස CIGAS පද්ධතිය වෙත යාවත්කාලීන කර ඇත. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ණය ශේෂ නිරවුල් කිරීම් හා වාර්තා ගත කිරීම සිදු කල යුතුය. |

2.6 **තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොදු තැන්පත් ගිණුමේ ශේෂ එකතුව රු.816,368,673 ක් වූ අතර ඉන් රු.382,490,455 ක් වර්ෂ 02 ක් ඉක්මවා ගොස් තිබුණි. එය මුළු තැන්පතු වලින් සියයට 47 ක ප්‍රතිශතයක් විය. එය මු.රෙ 571(2) ප්‍රකාරව රජයේ ආදායමට බැරකිරිමට කටයුතු කළයුතු වුවත් එසේ කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මු.රෙ 571(2) ප්‍රකාරව රජයේ ආදායමට බැරකිරිමට කටයුතු කළ යුතුය. |

**2.7 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික විසර්ජන පනත මගින් ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ අදාල මූල්‍ය වර්ෂයේ වියදම් සඳහා පමණක් වන බැවින් එම ප්‍රතිපාදනවලින් ඉදිරි වර්ෂ වෙනුවෙන් භාණ්ඩ මිල දී ගැනීම විසර්ජන පනතේ නීතිරීති උල්ලංඝනය කිරීමක් වන අතර දෙපාර්තමේන්තුව විසින් එම නීතිරීති උල්ලංගනය කරමින් ඉදිරි වර්ෂ ගණනාවකට ප්‍රමාණවත්වන පරිදි රු.3,900,511 ක් වැය කර භාණ්ඩ රැස්කර තිබුණි. නිලධාරීන් විසින් හිතාමතාම එය සිදු කර ඇති බැවින් වියදම් කලමනාකරණය ඉතා පහළ මට්ටමක පැවතුණි. ඒ අනුව වෙනත් ඵලදායි කාර්යයක් සඳහා කාර්යක්ෂමව යෙදවිය හැකිව තිබුණු විශාල මුදලක් නිෂ්කාර්ය ලෙස ලිපිද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා යොදවා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | විසර්ජන පනතේ නීතිරීති උල්ලංඝනය නොවන පරිදි කටයුතු කළ යුතුය. |

**2.8 බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 195 ක තැන්පතු වටිනාකම රු.123,481,808 ක් විය. එම චෙක්පත් අතරින් මාස 2 ත් මාස 12 ත් අතර කාලයක් ඉක්ම වූ රු.649,944 ක් වටිනා චෙක්පත් 61 ක් ද, වර්ෂය ඉක්ම වූ රු.14,126,584 ක් වටිනා චෙක්පත් 97 ක් වූ අතර ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ගනුදෙනු සම්බන්ධයෙන් බැංකුවෙන් විමසා නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කරමි. | තැන්පත් කල චෙක්පත් පිළිබඳව බැංකුවෙන් විමසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) 2021 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව හඳුනා නොගත් වර්ෂ 2 ක ඉක්මවූ රු.2,277,279 ක සහ වර්ෂය ඉක්මවූ රු.15,537,059 ක තැන්පතු එකතුව රු.17,814,338 ක් සහ හඳුනා නොගත් වර්ෂ 2 ක් ඉක්ම වූ රු.7,792 ක් පැවති අතර මෙම තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. ඉදිරියේ දී නිවැරදිව බැංකු සැසඳුම් සකස් කිරීමට ඒ සම්බන්ධ නිලධාරියාට උපදෙස් ලබා දුන් අතර , ඉදිරියේ දී මාණ්ඩලික නිලධාරීන් විසින් පරීක්ෂා කර බැංකු සැසඳුම් විගණනය සඳහා එවීමට කටයුතු කරමි. | නිවැරදිව බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2019 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් දක්වා මන්නාරම දිසා වන කාර්යාලය යටතේ පාලනය වන රක්ෂිත වනාන්තර හෙක්ටයාර් 137.03 කට හානි සිදු කර තිබුණි. නිලධාරීන් සිය රාජකාරි නිසිලෙස ඉටු කළේ නම් කාලීනව වන අපරාධ හඳුනා ගැනිමටත් ඒවා සිදු | පිළිතුරු ලබා දී නොමැත. | නිලධාරීන් සිය රාජකාරි කාර්යක්ෂමව ඉටු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වීම වැලැක්වීමට හා අවම කර ගැනීමටත් හැකියාව පැවති බව විගණනයෙදි නිරීක්ෂණය විය. | | |
| (ආ) | මන්නාරම අච්චන්කුලම් කඩොලාන රක්ෂිතය තුල හෙක්ටයාර් 01 ක් පමණ හෙළිකර ස්ථිර ගොඩනැගිල්ලක් ලෙස එළු කොටුවක් ඉදිකර තිබුණ ද, 2021 දෙසැම්බර් වන විටත් වනයට සිදු කරන ලද අලාභය තක්සේරු කර නොතිබුණු අතර වන සංරක්ෂණ ආඥා පනතට අනුව නඩු පැවරීමට කටයුතු කර නොතිබුණි. | - එම - | පනතේ විධිවිධාන ප්‍රකාරව නිලධාරීන් සිය රාජකාරි ඉටු කළ යුතුය. |
| (ඇ) | 2018 සැප්තැම්බර් 18 දින සිට 2021 මාර්තු 02 දින දක්වා දැව ව්‍යාපාර ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කළ ව්‍යාපාරිකයන් 24 ක් ලියාපදිංචි බලපත්‍ර නොමැතිව ව්‍යාපාර පවත්වාගෙන යන බව මන්නාරම සහකාර දිසාවන නිලධාරි විසින් මන්නාරම අඩවි වන නිලධාරීට දැනුම් දී තිබුණ ද ඒ පිළිබඳව පරීක්ෂා කර බැලීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | - එම - | - එම - |
| (ඈ) | වවුනියාව දිසා වන කාර්යාලය යටතේ පාලනය වන වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර් 111,493.83 ක් බව නිරීක්ෂණය වූ අතර 2021 ඔක්තෝබර් 15 දින වන විට ඉන් හෙක්ටයාර් 72,941.22 ක් පමණක් ගැසට් කර තිබුණු අතර ඉතිරි හෙක්ටයාර 38,552.61 හි මැණීම් සිදු කර තිබුණ ද, ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | - එම - | මැණීම් සිදු කර ඇති වනාන්තර ගැසට් කිරීම කඩිනම් කළ යුතුය. |

## 3.2 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ ESCAMP ව්‍යාපෘති ප්‍රතිපාදනවලින් රෝපණය කරන ලද මඩු හා වෙට්ටියාර් පැළ තවාන් වල ඇති පැළ 62,046 ක් 2021 දෙසැම්බර් වන විටත් බෙදා හැරීමට කටයුතු කර නොතිබුණු බැවින් පැළ නඩත්තු කිරීම වෙනුවෙන් තවත් රු.2,528,390 ක නිශ්කාර්ය වියදමක් දැරීමට සිදු වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | රෝපණය කරන ලද පැළ බෙදා දීම කඩිනමින් සිදු කළ යුතුය. |
| (ආ) | කඩොලාන වනාන්තර ප්‍රතිස්ථාපනය ව්‍යාපෘතිය යටතේ මන්නාරම දිසා වන නිලධාරී කාර්යාලය හෙක්ටයාර් 110 ක කඩොලාන නැවත වගා කිරීම සහ කඩොලාන වනාන්තර සංරක්ෂණය කිරීමේ වැඩසටහන් ආරම්භ කර තිබුණි. මෙහි දී වෙඩිතලතිව් කඩොලාන වනයේ පැළ 70,000 ක් රෝපණය කර තිබුණ ද ඉන් පැළ කිසිවක් ජීවී තත්ත්වයේ නොතිබුණි. ඒ අනුව අළුතින් පැළ රෝපණය කිරීම අසාර්ථක වී තිබුණු අතර ඒ සඳහා දරන ලද රු.13,020,330 ක මුදලින් වැඩි කොටසක් නිශ්කාර්ය වී තිබුණි. | - එම - | සිටුවන ලද පැල ආරක්ෂා කර පවත්වා ගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික | පිළිතුරු ලබා දී නොමැත. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කළ යුතුය. |

කාර්යසාධන වාර්තාව පිළියෙල කර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාහන 40 කට වඩා වැඩි ගණනක් වර්ෂ ගණනාවක සිට භාවිතයෙන් තොරව නිෂ්ක්‍රියව පවතින අතර ඒවා අලුත්වැඩියා කර තවදුරටත් භාවිතයට ගැනිමට හැකිනම් ඒ සඳහා හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. මෙම වාහනවල වටිනාකම් විගණනය සඳහා ඉදිරිපත් නොවිය. | - එම - | වත්කම් ප්‍රයෝජනයට ගැනිමට හෝ ප්‍රයෝජනයට ගත නොහැකි නම් සුදුසු පියවර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුව සතු මෝටර් සයිකල් 400 කට අධික ප්‍රමාණයක් තිබෙන අතර ඒවායේ වටිනාකම් නිවැරදිව හදුනාගෙන නොතිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට මෝටර් සයිකල් වල පිරිවැය රු.35,000 ක් බව අවසන් මූල්‍ය ප්‍රකාශනයෙහි දක්වා තිබුණි. ඒ අනුව ආයතනයේ වත්කම් නිවැරදිව තක්සේරු කර නිවැරදිව ලේඛනගත කිරිමක් සිදු කර නොතිබුණි. | - එම - | වත්කම් නිවැරදිව ගණනය කර ලේඛනගත කළ යුතුය. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 ට අනුව සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12 ක කාලයකට පසුව හෝ කිලෝමීටර් 25,000 ක් ධාවනය කිරිමෙන් අනතුරුව හෝ එන්ජිම සම්බන්ධව ප්‍රධාන අලුත් වැඩියාවක් කිරිමෙන් පසුව යනඅවස්ථාවලින් පළමුව එළඹෙන අවස්ථාවෙදී ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවත් වර්ෂ ගණනාවක සිට දෙපාර්තමේන්තුව විසින් වාහන වල ඉන්ධන දහනය පරික්ෂා කර නොතිබුණි. | - එම - | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

**3.5 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මු.රෙ.104(4) ප්‍රකාරව අලාභ හානි සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුලත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළයුතු වුවත්, 2020 සැප්තැම්බර් 23 සහ 2020 ඔක්තෝබර් 02 දින සිදු වූ වාහන අනතුරු 02 ක් සම්බන්ධයෙන් 2022 පෙබරවාරි අවසන් වන විටත් එසේ කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මු.රෙ.104 ට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2017 පෙබරවාරි 05 සහ 2018 මාර්තු 14 යන දිනවල සිදුවූ 2021 දෙසැම්බර් 31 දින වන විට බේරුම් කර තිබුණු රු.524,400 ක් වූ හානි වල ඇස්තමේන්තු වටිනාකම අවසන් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබුණි. | - එම - | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඇ) | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ, තව දුරටත් අයකර ගැනිමට හෝ කපාහැරිමට හෝ අත්හැරිමට ඇති පාඩු පිලිබඳ ප්‍රකාශය අනුව, අයකර ගතයුතු වටිනාකම රු.26,376,719 ක් වුවද කාල විශ්ලේෂණය අනුව එම අගය රු.9,376,719 ක් වුයෙන් රු.17,000,000 ක වෙනසක් පැවතුනි. | - එම - | -එම- |
| (ඈ) | වටිනාකම රු.25,000 ට අඩු වාහන අනතුරුවලට අදාලව රු.71,650 ක් වටිනා ලිපිගොනු 07 ක් සහ රු.25,000 කට වැඩි වාහන අනතුරුවලට අදාලව රු.6,383,801 ක් වටිනා ලිපිගොනු 24 ක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි. | - එම - | ලිපිගොණු සුරක්ෂිතව තබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | වර්ෂ 10 කට පෙර ගම්පහ දිසා වන කාර්යාලයේ සිදු වී තිබුණු රු.1,684,460 ක මුදල් වංචාවක් 2021 දෙසැම්බර් 31 වන විට ද දෙපාර්තමේන්තුව විසින් බේරුම් කරගෙන නොතිබුණි. | - එම - | මු.රෙ.104 ට අනුව කටයුතු කළ යුතුය. |

### 3.6 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 වර්ෂයේ දී අවසාන අර්ධ වර්ෂය සඳහා පමණක් ලිපිද්‍රව්‍ය මිල දී ගත යුතුව තිබුණ ද, ඉදිරි වර්ෂ ගණනාවකට ප්‍රමාණවත් වන පරිදි ලිපි ද්‍රව්‍ය මිලදී ගෙන සියළුම ලිපි ද්‍රව්‍ය අදාල අංශ වෙත නිකුත් කර තිබුණි. එම තොගවලින් විශාල ප්‍රමාණයක් 2022 මාර්තු මාසය වනවිටත් අදාල අංශවල ඉතිරි වී තිබුණි. මෙම තොග, ලේඛන ගත කර අවශ්‍යතා අනුව නිකුත් කිරීම සඳහා එම අංශ තුළ විධිමත් පාලන ක්‍රමයක් ස්ථාපිත කර නොතිබුණි. ඒ අනුව අදාල අංශ තුල ලිපිද්‍රව්‍ය භාවිතය පිළිබඳව විනිවිද භාවයක් නොපවතින අතර විවිධ අක්‍රමිකතාවයන් සිදුවීමේ ඉඩකඩ පවතින බව ද විගණනයේ දී බැහැර කල නොහැක. | පිළිතුරු ලබා දී නොමැත. | නිවැරදි තොග පාලන ක්‍රමයක් ආයතනය තුළ ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2020 නොවැම්බර් 13 දිනැති අංක 14/2020 දරන ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3.2 ඡේදය ප්‍රකාරව අදාළ හිඟ මුදල් වසර 03 ක් තුල මාසික වාරික 36 කින් ගෙවා නිම කිරීම සහ පළමු හිඟ වාරික මුදල ගෙවීමෙන් අනතුරුව පවතින වර්ෂය සඳහා කැණීම් බලපත්‍ර නිකුත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. එහෙත් එම තීරණයට පටහැනිව වවුනියා දිසා වන කාර්යාලය විසින් කැණීම් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට බලපත්‍ර නිකුත් කර තිබුණි. | 2021 වර්ෂය සඳහා ඛනිජ ද්‍රව්‍ය නිකුත් කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් 2020.12.23 දිනැති ලිපිය මඟින් දන්වා ඇත. ඒ අනුව 2020.12.31 වන දින අවසන් වූ බලපත්‍ර හිමියන් හට ඛනිජ ද්‍රව්‍ය අඛණ්ඩව ලබාදීම සඳහා වන සංරක්ෂක ජනරාල්ගේ DFC/PLE/06/06/01/2021 හා 2021.02.22 දිනැති ලිපිය මඟින් වලංගු බලපත්‍ර කාලය දීර්ඝ කරන ලෙස දන්වා ඇත. එම ලිපියේ සඳහන් පරිදි බලපත්‍ර කාලය දීර්ඝ කිරීමේ කටයුතු 2021 පෙබරවාරි මාසයේ ආරම්භ කරන ලදි. | ආදායම් රැස් කිරීමේ දී කළුගල් කැඩීම සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් පවත්වාගෙන යා යුතු වීම හා නිවැරදි ගණනය යටතේ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) වවුනියාව අඩවියේ කරුංගාලිකුලම් බිට්ටුවේ මාමඩුව කොටසේ පිහිටි කළුගලෙන් 2021 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා ගල් කැඩීම සඳහා බලපත්‍රය ලබාගත් පෞද්ගලික කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුමේ 4 වන කොන්දේසිය උල්ලංඝනය කරමින් | බලපත්‍රලාභියාට කැණීම් බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් සිදු වූ හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා පුලියන්කුලම් ප්‍රදේශයේ අනවසර එළි කිරීමකට ලක් වී සම්පූර්ණයෙන්ම හානියට පත් වූ අක්කර 03ක කොටසක් ඔහු | නීතිය උල්ලංඝනය කළ විට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන වන සම්පත ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කැළයේ විශාල ප්‍රදේශයකට හානි සිදුකරමින් කැනිම් කර තිබුණි. මෙසේ ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කරමින් කැණීම් සිදුකර තිබියදීත් ඊට අදාල හානි තක්සේරු නොකොට 2021 ඔක්තෝබර් 15 දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා ගල් කියුබ් 6000 ක් කඩා ඉවත් කර ගැනීම සඳහා එම කොන්ත්‍රාත්කරුටම අනුමැතිය ලබා දී තිබුණි. | විසින් දිසා වන කාර්යාලය වෙත තැන්පත් කර ඇති ආරක්ෂණ ඇප තැන්පත් මුදලින් රු: 1,190,800 ක මුදලක් භාවිතා කර එම වන වගාව ප්‍රතිපූර්ණ කර අඛණ්ඩව අවුරුදු 03ක් නඩත්තු කිරීමට ඔහු විසින් කැමැත්ත ප්‍රකාශ කර ඇත. | |
| (ඇ) | වවුනියාව කරුංගාලිකුලම් රජයේ කැළයේ (වැලිකන්ද) කළුගල් කැඩීමේ ව්‍යාපාරයක් 2019 දෙසැම්බර් 31 දින දක්වා පවත්වාගෙන යෑම සඳහා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට "C" බලපත්‍රය ලබා දී තිබුණි. එය අළුත් කිරීමෙන් අනතුරුව ඔහුගේ ඉල්ලීම පරිදි වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට පැවරිම දිසාවන කාර්යාලය විසින් සිදු කර තිබුණත්, ඉකුත් කාල පරිච්ඡේදවල දී බලපත්‍ර සීමාව ඉක්මවා කැණීම් කළ කළුගල් වෙනුවෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතු රු.5,085,593 ක හිඟ මුදල් අයකර ගැනිම සඳහා දෙපාර්ශවයෙන් එක් පාර්ශවයකගෙන්වත් එකඟතාවයක් ලබාගෙන නොතිබුණු අතර එම හිඟ බලපත්‍ර ආදායම 2022 මැයි දක්වා අයකරගෙන නොතිබුණි. ඒ අනුව අදාල නිලධාරින් විසින් බලපත්‍ර පැවරීමේ විධිමත් ලෙස සිදු කර නොමැති අතර හිඟ මුදල් අය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ද ගෙන නොතිබුණි. | කළුගල් කැණීම් බලපත්‍රහිමියෙක් වන ආර්.ඒ. නලින් තුෂාර යන අය විසින් ගෙවිය යුතු හිඟ මුදල් සම්බන්ධයෙන් කළුගල් කැණීමේ දී එම පුද්ගලයා විසින් කැණීම් කර ඇති අතිරික්ත කළුගල් කියුබ් ප්‍රමාණයට අදාළ හිඟ මුදල් ආර්.ඒ. නලින් තුෂාර යන අය විසින්ම ගෙවන බවට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත. තවද, 2022 වර්ෂයේ සිට මෙම කළුගල් වැඩපොල ආර්.ඒ. නලින් තුෂාර යන අයගේ සහෝදරියක් වෙත කැණීම් බලපත්‍ර ලබා දී තිබුණි. එසේ වුවද එම ස්ථානයේ කැණීම් වෙනුවෙන් ගෙවිය යුතු හිඟ මුදල් කිසිදු හිඟයකින් තොරව ගෙවීමට කටයුතු කර ඇත. 2022 වර්ෂයේ සිට නැවතත් මෙම ස්ථානයේ කළුගල් කැණීම් කිරීම සඳහා තමා නමින් පවතින බලපත්‍රය තම සහෝදරයා වන නලින් තුෂාර යන අයට පවරන ලෙස ආර්.ඒ.ඩබ්. ශිරානි මිය නැවතත් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව ආර්.ඒ. නලින් තුෂාර යන අයද දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් එම ව්‍යාපාර තමන්ගේ නමට නැවතත් පවරන ලෙස ඉල්ලීමක් කර ඇත. ඒ අනුව අයිතිය පැවරීමට හා හිඟ ගාස්තු අයකිරීමට කටයුතු කරමින් පවතී. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මන්නාරම දැව ව්‍යාපාර 16 ක් 2021 වර්ෂය සඳහා ලියාපදිංචිය අළුත් කිරීම සඳහා කටයුතු කර නොතිබුණ අතර 2014 දෙසැම්බර් 03 දිනැති අංක 1891/26 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ 14(3)(1) ඡේදය ප්‍රකාරව එම දැව ව්‍යාපාර වල ලියාපදිංචිය අවලංගු කල යුතු වුවත් එසේ කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ලියාපදිංචිය අළුත් කිරීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඊ) | මන්නාරම දිසා වන කාර්යාලය විසින් වන අපරාධ සම්බන්ධයෙන් පනවන ලද නඩුවලට අදාල දඩ මුදල් සහ අලාභ අයකර ගැනීමේ දී උසාවිය මඟින් සත්‍ය වශයෙන් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල කොපමණද යන්න ගණනය කර එම මුදල් අයකර ගැනීම සඳහා ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණි. එම නිසා උසාවියෙන් දෙපාර්තමේන්තු ගිණුමට බැරකරන ලද මුදල් මත පදනම්ව කැළෑ දෙපාර්තමේන්තු අරමුදලේ ආදායම ගණනය කර තිබුණි. එමෙන්ම 2021 වර්ෂය තුල දී අවසන් වූ වන අපරාධ නඩු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට බැර කරන ලද මුදල් ප්‍රමාණයන් කොපමණද යන්න උසාවිය විසින් 2021 දෙසැම්බර් දක්වා දැනුම් දී නොතිබුණු අතර ඒ පිළිබඳව විමසීම් කර නියමිත මුදල් ප්‍රමාණයන් අය කර ගැනීමට නිලධාරීන් කටයුතු කර නොතිබුණි. | - එම - | ආදායම නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 වර්ෂයේ තිරසර සංවර්ධන අරමුණු ලගා කර ගැනීමේ භෞතික සහ මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු පැහැදිළිව දක්වා නොතිබුණු අතර 2021 ප්‍රගතිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය. | පිළිතුරු ලබා දී නොමැත. | වාර්ෂිකව භෞතික සහ මූල්‍ය ප්‍රගතිය මැනීමට කටයුතු කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 3,149 ක් වු අතර තත්‍ය සංඛ්‍යාව 2,437 ක් වුයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 712 ක් විය.<br><br>තවද තෘතියික මට්ටමේ සේවක පුරප්පාඩු සංඛ්‍යාවෙන් වනපාලක(විශේෂ පංතිය) හෝ දිසා වන නිළධාරීන් 18 දෙනෙකු, ද්විතික මට්ටමේ සේවක පුරප්පාඩු සංඛ්‍යාවෙන් අඩවි වන නිළධාරීන් 178 දෙනෙකු, බීට්ටු වන නිළධාරීන් 194 දෙනෙකු හා වන ව්‍යාප්ති නිළධාරීන් 24 දෙනෙකු සහ සුළු සේවක පුරප්පාඩු අතරින් වන ක්ෂේත්‍ර සහකාර තනතුරු 226 දෙනෙකු පුරප්පාඩු වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය. |